# 2020

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
தேசிய தொழில் கற்கைகள் நிறுவகம்
National Institute of Labour Studies

කම්කරු අමාත්‍යාංශය
தொழில் அமைச்சு
Ministry of Labour

# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
# වාර්ෂික වාර්තාව
# 2020

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**
**වාර්ෂික වාර්තාව - 2020**

**සියළු හිමිකම් ඇවිරිණි**

**සම්පාදනය**
පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති අංශය

**ප්‍රකාශන**
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය,
නාරාහේන්පිට, කොළඹ 05

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ.
දුරකථන අංකය - 0112 815 816
විද්‍යුත් තැපැල - salesprintec@gmail.com
වෙබ් අඩවිය - www.printec.lk

# පටුන


පිටුව

**පළමු පරිච්ඡේදය : ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම 06
1.2 දැක්ම, මෙහෙවර 06
1.3 අරමුණු 06
1.4 සංවිධාන සටහන 07
1.5 ආයතනික පරිපාලනය 07
1.6 කාර්ය මණ්ඩල තොරතුරු 08

**දෙවන පරිච්ඡේදය : ආයතනයේ ප්‍රගතිය**

2.1 පුහුණු වැඩසටහන් 11
2.1.1 ඩිප්ලෝමා පාඨමාලා 11
2.1.2 සහතික පත්‍ර පාඨමාලා 12
2.1.3 කෙටිකාලීන පුහුණු පාඨමාලා 12-13
2.1.4 විශේෂ වැඩමුළු 14
2.2 විභාග 16-17

**තුන්වන පරිච්ඡේදය : කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව හා මානව සම්පත් පැතිකඩ)**

3.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 21
3.2 සේවක සංඛ්‍යා කළමනාකරණය 21
3.3 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම 21
3.4 මානව සම්පත් සංවර්ධනය 21
3.5 දේශීය පුහුණු පාඨමාලා 22

**හතරවන පරිච්ඡේදය : 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය**

4.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 25
4.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 26
4.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 27
4.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 28-31
4.5 විගණකාධිපති වාර්තාව 32-39
4.6 විගණකාධිපති වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත් / ගැනීමට එකඟ වූ ක්‍රියාමාර්ග 40-41

# රූප සටහන්, වගු, ප්‍රස්තාර පෙළගැස්ම

## රූප සටහන්


| | | |
|---|---|---|
| රූප සටහන 1.1 සංවිධාන ව්‍යුහය | | 07 |


## වගු


| | | |
|---|---|---|
| වගුව 1.1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය | 07 |
| වගුව 1.2 | 2020.12.31 දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩල තොරතුරු | 08 |
| වගුව 2.1 | 2020 වර්ෂයේදී පවත්වන ලද ඩිප්ලෝමා පාඨමාලා | 12 |
| වගුව 2.2 | 2020 වර්ෂයේදී පවත්වන ලද සහතිකපත්‍ර පාඨමාලා | 12 |
| වගුව 2.3 | 2020 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් | 12 |
| වගුව 2.4 | 2020 වර්ෂයේදී සිදු කරන ලද එක්දින පුහුණු වැඩසටහන් | 13 |
| වගුව 2.5 | 2020 වර්ෂයේ පවත්වන ලද දෙදින පුහුණු වැඩසටහන් | 13 |
| වගුව 2.6 | 2020 වර්ෂයේ පවත්වන ලද තෙදින පාඨමාලා | 13 |
| වගුව 2.7 | 2020 වර්ෂයේදී පවත්වන ලද විශේෂ වැඩමුළු | 14 |
| වගුව 2.8 | 2020 වර්ෂයේදී පවත්වන ලද විභාග අරමුණු කරගත් වැඩමුළු | 14 |
| වගුව 2.9 | 2020 වර්ෂයේදී පවත්වන ලද විභාග | 16 |
| වගුව 3.1 | වැඩසටහන් මඟින් උපයා ගැනීමට ඉලක්ක ගත කළ සහ උපයන ලද මූල්‍ය ප්‍රගතිය | 21 |
| වගුව 3.2 | ආයතනයේ සේවක සංඛ්‍යාව | 21 |
| වගුව 3.3 | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් | 22 |
| වගුව 4.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 25 |
| වගුව 4.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 26 |
| වගුව 4.3 | මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 27 |


## ප්‍රස්තාර


| | |
|---|---|
| ප්‍රස්තාරය 2.1 2020 වර්ෂයේ පුහුණු වැඩසටහන්හි සමස්ත දළ ආදායම | 15 |
| ප්‍රස්තාරය 2.2 2020 වර්ෂයේ පුහුණු වැඩසටහන්හි දළ ආදායම මාසිකව | 15 |
| ප්‍රස්තාරය 2.3 2020 වර්ෂයේ විභාග කටයුතුවල දළ ආදායම | 17 |

# පළමු පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය (NILS)

## 1.1 හැඳින්වීම (ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය)

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මගින් බලාත්මක කරන ලදී. කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ සේවකයින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් ආයතනය පාලනය වේ.

කම්කරු අණපනත්, නීති, රීති රෙගුලාසි පිළිබඳව දැනුවත්, ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ මූලික කාර්යභාරයයි. වෘත්තීය සමිති ක්‍රියාකාරීන් හා සේවක පාර්ශව සඳහා වඩාත් ඵලදායී සේවාවක් සැපයීමේ අරමුණින් යුතුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මේ වන විට කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන මහලේ ස්ථාපිත කොට පවත්වාගෙන යනු ලැබේ.

## 1.2 දැක්ම, මෙහෙවර

**දැක්ම**

ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය සහ සංහිඳියාව

**මෙහෙවර**

අධ්‍යාපන, පර්යේෂණ සහ පුහුණුව ඔස්සේ ඵලදායී කම්කරු සබඳතාවයන් පවත්වා ගැනීම සඳහා ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් වෙත පහසුකම් සැලසීම

## 1.3. අරමුණු

- දේශීය හෝ විදේශිය ආයතන සමඟ සහයෝගීත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම, සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ සුභසාධනය සහතික කරනු පිණිස පියවර ගැනීම

- ශ්‍රම අධ්‍යයන පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල්, වාර ප්‍රකාශන සහ පොත් පළ කිරිම

- පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාළ පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම
- පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම

- මේ හා සමාන අරමුණු සහිත, ජාතික හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීත්වයෙන් කටයුතු කිරිම

- විශ්ව විද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

- කාර්මික සමගිය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

## 1.4 සංවිධාන සටහන




රූප සටහන 1.1 සංවිධාන ව්‍යුහය

## 1.5 ආයතනික පරිපාලනය

**පාලක මණ්ඩලය**

ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය සඳහා පනත මඟින් ආයතනය වෙත පැවරී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීම පාලක මණ්ඩලය වෙත පවරා ඇත.

පාලක මණ්ඩලය නිල බලයෙන් පත්වන සාමාජිකයන් සය දෙනෙකුගෙන් සහ විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් දහතුන් දෙනෙකුගෙන් සමන්විත වේ. කම්කරු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා වන අතර කම්කරු කොමසාරිස් ජනරාල්වරයා මණ්ඩලයේ උප සභාපති වේ.

වගුව 1.1 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය

| නම | තනතුර | ආයතනය |
|---|---|---|
| එම් පී ඩී යු කේ මාපා පතිරණ මයා | සභාපති (2020.08.14 දින සිට) | ලේකම්, කම්කරු අමාත්‍යාංශය |
| ඩී එම් සරත් අබයගුණවර්ධන මහතා | සභාපති (2020.08.13 දින දක්වා) | |
| බී කේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මයා | උප සභාපති (2020.10.20 දින සිට) | කම්කරු කොමසාරිස් ජනරාල් |
| ඒ විමලවීර මහතා | උප සභාපති (2020.10.19 දින දක්වා) | |
| ජේ එම් එස් පී බී ජයතිලක මයා | අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) (2020.10.22 දින සිට) | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය |
| එච් එම් ඩී එන් කේ වටලියද්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් (2020.10.21 දින දක්වා) | |
| ඩී ඩබ් ඩබ් පී ගුණරත්න මිය | පාලක මණ්ඩල සාමාජික | නියෝජ්‍ය අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය |
| බී ඩී එල් එම් ධර්මසේන මිය | පාලක මණ්ඩල සාමාජික | නියෝජ්‍ය අධ්‍යක්ෂ, කර්මාන්ත අමාත්‍යාංශය |
| මහාචාර්ය එච් ඩී කරුණාරත්න මයා | පාලක මණ්ඩල සාමාජික | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය |

| | | |
|---|---|---|
| ආචාර්ය ඩබ් එස් චන්ද්‍රසේකර මයා | පාලක මණ්ඩල සාමාජික | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්ව විද්‍යාලය |
| ඩබ් කේ එල් වීරසිංහ මයා | පාලක මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ ජනරාල්,<br>ප්‍රධාන විධායක නිලධාරී,<br>හාම්පුතුන්ගේ සම්මේලනය |
| දිත්තා ද අල්විස් මයා | පාලක මණ්ඩල සාමාජික | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ ජනරාල්,<br>හාම්පුතුන්ගේ සම්මේලනය |
| ආර් පණ්ඩිත කෝරාළගේ මයා | පාලක මණ්ඩල සාමාජික | හාම්පුතුන්ගේ සම්මේලනයේ නියෝජිත |
| අමරපාල ගමගේ මයා | පාලක මණ්ඩල සාමාජික | වෘත්තීය සමිති නියෝජිත |
| පී කේ සිරිසේන මයා | පාලක මණ්ඩල සාමාජික | වෘත්තීය සමිති නියෝජිත |
| බන්දුල සමන්කුමාර මයා | පාලක මණ්ඩල සාමාජික | වෘත්තීය සමිති නියෝජිත |

## 1.6 කාර්ය මණ්ඩල තොරතුරු

වගුව 1.2 2020.12.31 දිනට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩල තොරතුරු

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | වත්මන් කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| අධ්‍යක්ෂ (පර්යේෂණ, උපදේශන, සැලසුම් සහ ප්‍රකාශන) | 01 | - |
| අධ්‍යක්ෂ (පුහුණු සහ සංවර්ධන) | 01 | - |
| සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ | 05 | 02 |
| ගණකාධිකාරී | 01 | 01 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | 01 | - |
| ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී | 01 | 01 |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| සැලසුම් නිලධාරී | 01 | - |
| මූල්‍ය නිලධාරී | 01 | - |
| වැඩසටහන් නිලධාරී | 03 | 03 |
| සංවර්ධන නිලධාරී | 01 | - |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 | - |
| පුස්තකාලයාධිපති | 01 | - |
| භාෂා පරිවර්තක | 02 | - |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 18 | 08 |
| රියදුරු | 03 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 02 | 01 |
| **එකතුව** | **45** | **18** |

# දෙවන පරිච්ඡේදය

## ආයතනයේ ප්‍රගතිය

# ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

## 2.1 පුහුණු වැඩසටහන්

යහපත් කම්කරු සබඳතාවයක් පවත්වා ගනිමින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වන ඵලදායී ශ්‍රම බලකායක් ඇති කිරීම වෙනුවෙන් ප්‍රධාන විෂයපථ තුනක් ඔස්සේ ආයතනය පුහුණු හා අධ්‍යාපන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

1. කම්කරු නීතිය හා කාර්මික සබඳතා
2. මානව සම්පත් කළමනාකරණය
3. වැඩපළ ඵලදායීතාවය

පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන්, සේව්‍යයන් හා වෘත්තීය සමිති නායකයන් වැනි නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා අවශ්‍ය වන අධ්‍යාපන සහ පුහුණු අවස්ථා ආයතනය මඟින් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ කෙටි කාලීන මෙන්ම දිගුකාලීන පුහුණු වැඩසටහන් සංවිධානය කර පවත්වනු ලබයි. එම පුහුණු වැඩසටහන් කම්කරු නීති හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය, ඵලදායීතාවය, කාර්යාල කළමනාකරණය, ප්‍රසම්පාදනය ආදී ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සකස් කර ඇත.

### සම්පත්දායකයන්

ඒ ඒ විෂය ක්ෂේත්‍රයට අදාළව විශේෂඥ දැනුම සහිත පළපුරුදු, ප්‍රවීණ බාහිර සම්පත්දායකයන් විසින් පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. මෙම සම්පත්දායක මණ්ඩලයට විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, ජාතික අධ්‍යාපන ආයතනයන්හි දැනට සේවයේ නියුතු සහ පූර්ව සේවා සපයන ලද විද්වතුන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, රජයේ සහ පෞද්ගලික ආයතනවල සේවයේ නියුතු / විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද ඇතුළත් වේ.

### 2.1.1 ඩිප්ලෝමා පාඨමාලා

දිගුකාලීන පුහුණු වැඩසටහන් යටතේ ඩිප්ලෝමා පාඨමාලාවන් දෙකක් 2020 වර්ෂයේ අවසන් කළ අතර නව ඩිප්ලෝමා පාඨමාලා දෙකක් වර්ෂ අවසානයේ ආරම්භ කරන ලදී. ඩිප්ලෝමා පාඨමාලාව මොඩියුල අටකින් සමන්විත වන අතර එක් මොඩියුලයක් සති හයක දේශනවලින් සමන්විත වේ.

ඩිප්ලෝමා පාඨමාලාවන්ට අදාළ මොඩියුල පහත පරිදි වේ.

කම්කරු නීතී හා කාර්මික සබඳතා ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ මොඩියුල
- සේවා නියුක්ති නියමයන් හා කොන්දේසි
- සමාජ ආරක්ෂණය
- කාර්මික සබඳතා, වෘත්තිය සමිති හා සමාජ සංවාදය
- කාර්මික ආරවුල් විසඳීම
- සේවය අවසන් කිරීම
- කාර්මික සබඳතා හා මතුවන ගැටලු
- වෘත්තීමය ආරක්ෂාව හා සෞඛ්‍ය
- කම්කරු නීතිවලට අදාළ ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ මොඩියුල
- කළමනාකරණ ක්‍රියාවලිය සහ සංවිධානය
- මානව සම්පත් කළමනාකරණ සංකල්පය හා ප්‍රායෝගික භාවිතය
- මානව සම්පත් කළමනාකරුවෙකු සඳහා අවශ්‍ය නිපුණතාවයන්
- ඉහළ ඵලදායීතාවය සඳහා අභිප්‍රේරණය
- කම්කරු නීති හා කාර්මික සබඳතා
- සංවිධාන චර්යාව
- වෘත්තියමය ආරක්ෂාව හා සෞඛ්‍ය
- මානව සම්පත් කළමනාකරණයේ ප්‍රවණතා හා අභියෝග

වගුව 2.1 2020 වර්ෂයේදී පවත්වන ඩිප්ලෝමා පාඨමාලා

| අනු අංකය | වැඩසටහනේ නම | කාල පරිච්ඡේදය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කම්කරු නීති සහ කාර්මික සබඳතා (ඉංග්‍රීසි මාධ්‍යය, මාර්ගගත) | 2020 / 2021 | 20 |
| 02 | කම්කරු නීති සහ කාර්මික සබඳතා (සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යය) | 2020 / 2021 | 24 |

**2.1.2 සහතිකපත්‍ර පාඨමාලා**

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් කම්කරු නීති හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, ප්‍රසම්පාදනය, අභ්‍යන්තර විගණනය, ඉංග්‍රීසි හා දමිළ භාෂාවන් ආවරණය වන පරිදි එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව දින හයක පාඨමාලාවක් ලෙස පවත්වයි.

වගුව 2.2 2020 වර්ෂයේදී පවත්වන ලද සහතික පත්‍ර පාඨමාලා

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රැකවරණ නිලධාරී දැනුම වර්ධනය | 2020.07.03 - 2020.09.11 | 33 |
| | **මාර්ගගත වැඩසටහන්** | | |
| 02 | කම්කරු නීති හා කාර්මික සබඳතා (ඉංග්‍රීසි මාධ්‍යය) | 2020.06.14 - 2020.06.26 | 32 |
| 03 | කම්කරු නීති හා කාර්මික සබඳතා (සිංහල මාධ්‍යය) | 2020.07.24 - 2020.09.11 | 19 |
| 04 | කම්කරු නීති හා කාර්මික සබඳතා (ඉංග්‍රීසි මාධ්‍යය) | 2020.10.08 - 2020.12.06 | 34 |
| 05 | මානව සම්පත් කළමනාකරණය (ඉංග්‍රීසි මාධ්‍යය) | 2020.11.26 - 2021.02.18 | 22 |
| 06 | මානව සම්පත් කළමනාකරණය (සිංහල මාධ්‍යය) | 2020.12.15 - 2021.09.03 | 14 |

**2.1.3 කෙටි කාලීන පුහුණු පාඨමාලා**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් එක්දින, දෙදින, තෙදින සහ සිව්දින ආදී වශයෙන් වූ කෙටිකාලීන පාඨමාලා ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුහුණු මධ්‍යස්ථානයේ දී හා සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි ඉලක්කගත පාර්ශවයන් වෙනුවෙන් අදාළ ස්ථානවල දී පවත්වනු ලැබේ.

බාහිර ආයතනයන් මඟින් ඉදිරිපත් වන ඉල්ලීම් අනුව සිදු කරනු ලැබූ පුහුණු වැඩසටහන් 05ක් පුහුණුලාභීන් 175ක් වෙනුවෙන් පවත්වා ඇත.

**ඉල්ලීම අනුව සිදු කළ පුහුණු වැඩසටහන්**

වගුව 2.3 2020 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රියදුරු හා කාර්යාල කාර්ය සහායක නිපුණතා සංවර්ධනය | 2020.07.31 | 10 |
| 02 | ප්‍රසම්පාදන කමිටුව මඟින් ඇති වන දුර්වලතා සහ ප්‍රමාදයන් අවම කිරීම | 2020.08.11,14 | 35 |
| 03 | ලිපිගොනුකරණය | 2020.08.14 | 50 |
| 04 | ලිපිගොනුකරණය හා සටහන් ලිවීම | 2020.09.24 | 40 |
| 05 | ලැබීම් හා ගෙවීම් කළමනාකරණය | 2020.09.24 | 40 |

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් එක්දින, දෙදින සහ තෙදින වශයෙන් වූ කෙටිකාලීන පාඨමාලා 17ක් 2020 වර්ෂයේ පවත්වා ඇත.

### එක්දින පුහුණු වැඩසටහන්

වගුව 2.4 2020 වර්ෂයේදී සිදු කරන ලද එක්දින පුහුණු වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | පෞද්ගලික ලිපිගොනු ඵලදායී ලෙස පවත්වාගෙන යාම | 2020.02.25 | 21 |
| 02 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 2020.02.27 | 21 |
| 03 | වෘත්තීය සමිතිවල කාර්යභාරය සහ වගකීම | 2020.03.12 | 41 |
| 04 | කම්කරු නීතියේ නව ප්‍රවණතා | 2020.03.13 | 08 |
| 05 | ලිපිගොනුකරණය | 2020.08.24 | 12 |
| 06 | අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම | 2020.09.11 | 13 |
| 07 | සාමූහික ගිවිසුම | 2020.12.15 | 31 |
| | මාර්ගගත වැඩසටහන් | | |
| 01 | විනය කාර්ය පටිපාටිය | 2020.11.30 | 30 |
| 02 | කාර්මික නීතිය පිළිබඳ දැනුම | 2020.12.16 | 09 |

### දෙදින පුහුණු වැඩසටහන්

වගුව 2.5 2020 වර්ෂයේ පවත්වන ලද දෙදින පුහුණු වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රියදුරු නිපුණතා සංවර්ධනය | 2020.02.10, 11 | 12 |
| 02 | කාර්යාල කළමනාකරණය සහ මුදල් රෙගුලාසි | 2020.02.24, 25 | 14 |
| 03 | සහාය කාර්යමණ්ඩල සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2020.03.11, 12 | 26 |
| 04 | රාජ්‍ය සේවයට බඳවා ගැනීම හා සම්බන්ධිත රාජකාරී | 2020.03.12, 13 | 11 |
| 05 | ප්‍රසම්පාදන කමිටුව මඟින් ඇති වන දුර්වලතා සහ ප්‍රමාදයන් අවම කිරීම | 2020.08.10, 18 | 09 |
| 06 | රියදුරු නිපුණතා සංවර්ධනය | 2020.08.17, 18 | 07 |
| 07 | විනය කාර්ය පටිපාටිය | 2020.09.24, 25 | 28 |

### තෙදින පාඨමාලා

වගුව 2.6 2020 වර්ෂයේ පවත්වන ලද තෙදින පාඨමාලා

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 2020.02.20,27, 03.05 | 15 |

### 2.1.4 විශේෂ වැඩමුළු

වගුව 2.7 2020 වර්ෂයේදී පවත්වන ලද විශේෂ වැඩමුළු

| අනු අංකය | වැඩසටහනේ නම | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සේවය අවසන් කිරීම | 2020.07.30 | 20 |

**විභාග අරමුණු කරගත් වැඩමුළු**

වගුව 2.8 2020 වර්ෂයේදී පවත්වන ලද විභාග අරමුණු කරගත් වැඩමුළු

| අනු අංකය | වැඩමුළුවේ නම | ආයතනය | පවත්වන ලද දිනය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කළමනාකරණය සහ මුදල් රෙගුලාසි | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 2020.02.06,07 | 19 |
| 02 | විශේෂ පුහුණු වැඩසටහන | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 2020.02.07 | 218 |
| 03 | විශේෂ පුහුණු වැඩසටහන | ශ්‍රම වාසනා අරමුදල | 2020.07.18,19, 20 | 05 |
| 04 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 01 | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය | 2020.08.18 | 08 |
| 05 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 02 | | 2020.08.21 | 10 |
| 06 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 03 | | 2020.08.25 | 46 |
| 07 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 04 | | 2020.08.28 | 04 |
| 08 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 05 | | 2020.09.04 | 08 |
| 09 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 06 | | 2020.09.17 | 05 |
| 10 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 01 | ජාතික යෞවුන් සේනාංකය | 2020.09.18 | 60 |
| 11 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 02 | | 2020.09.25 | 36 |
| 12 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 03 | | 2020.09.25 | 04 |
| 13 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 04 | | 2020.09.30 | 118 |
| 14 | කාර්යක්ෂමතා කඩඉම් විභාගය පදනම් කර ගත් වැඩසටහන 05 | | 2020.10.12 | 02 |

**2020 ජනවාරි මස සිට 2020 දෙසැම්බර් මස දක්වා පුහුණු වැඩසටහන්වල දළ ආදායම සිදු කරන ලද වැඩසටහන් අනුව (රුපියල්වලින් දැක්වේ).**




ප්‍රස්තාරය 2.1 2020 ජනවාරි මස සිට 2020 දෙසැම්බර් මස දක්වා පුහුණු වැඩසටහන්වල දළ ආදායම

**2020 වර්ෂයේ පුහුණු කටයුතුවල දළ ආදායම (රුපියල්)**




ප්‍රස්තාරය 2.2 2020 වර්ෂයේ පුහුණු වැඩසටහන්වල දළ ආදායම

## 2.2 විභාග

රාජ්‍ය අංශයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනයන්හි ඉල්ලීම් මත විභාග පැවැත්වීමේ කාර්යභාරය වසර ගණනාවක සිට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් සිදුකරනු ලබයි. මේ යටතේ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග, ඇගයීම් සහ සේවා උසස් කිරීම් සඳහා වූ විභාග ආයතනික අවශ්‍යතාව මත පවත්වනු ලබයි. තවද ආයතනයේ පවත්වන ඩිප්ලෝමා පාඨමාලාවන් හා සහතික පත්‍ර පාඨමාලාවන්ට අදාළ විභාගයන් ද පවත්වන අතර මෙම විභාගවල රහස්‍යභාවය ආරක්ෂාකර ගනිමින් වෘත්තීමය භාවයකින් යුක්තව පැවැත්වීමටත්, සේවාලාභීන්ට කඩිනම් සේවයක් ලබා දීමත් සිදු කෙරේ.

2020 වසර තුළ ඇතිවූ කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ වුවද විභාග 20ක් පවත්වා ඇති අතර බාහිර ආයතන වෙනුවෙන් කරන ලද විභාග මඟින් රුපියල් මිලියන 3.03ක ආදායමක් උපයා ඇත. මේ සඳහා අයදුම්කරුවන් 1160ක ප්‍රමාණයක් සහභාගී වී ඇත.

වගුව 2.9 2020 වර්ෂයේදී පවත්වන ලද විභාග

| අනු අංක | මාසය | විභාගයේ නම | පවත්වන ලද දිනය | අපේක්ෂක සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1 | පෙබරවාරි | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශ්‍රේණි උසස් කිරීමේ විභාගය | 2020.02.29 | 235 | 464,825.00 |
| 2 | | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ප්‍රාථමික සේවා ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කා. කඩඉම් විභාගය | 2020.02.27 | 02 | 36,050.00 |
| 3 | | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ශ්‍රේණි උසස් කිරීමේ විභාගය | 2020.06.16 | 09 | 23,330.00 |
| 4 | ජූලි | ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ කා. කඩඉම් විභාගය | 2020.07.15 | 10 | 72,875.00 |
| 5 | | මැතිවරණ කොමිෂන් සභාවේ කා. කඩඉම් විභාගය | 2020.07.16 | 03 | 57,025.00 |
| 6 | | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ කා. කඩඉම් විභාගය | 2020.07.28 | 14 | 15,300.00 |
| 7 | | පොල් වගාකිරීමේ මණ්ඩලයේ කා. කඩඉම් විභාගය | 2020.07.29 | 152 | 671,200.00 |
| 8 | අගෝස්තු | කම්කරු දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී කා. කඩඉම් විභාගය | 2020.08.12 | 03 | 34,825.00 |
| 9 | | ශ්‍රම වාසනා අරමුදලේ කා. කඩඉම් විභාගය | 2020.08.13 | 05 | 78,000.00 |
| 10 | | කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරී පළමු කා. කඩඉම් විභාගය | 2020.08.29 | 175 | 276,750.00 |
| 11 | | කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරී දෙවන කා. කඩඉම් විභාගය | 2020.08.29 /30 | 66 | 289,925.00 |
| 12 | | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කා. කඩඉම් විභාගය | 2020.08.28 | 04 | 44,800.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | සැප්තැම්බර් | කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස් 1 නිලධාරී පළමු කා. කඩඉම් විභාගය | 2020.09.04/10/11 | 02 | 65,775.00 |
| 14 | | කාන්තා, ළමා හා වියළි කලාප කටයුතු අමාත්‍යාංශයේ කා. කඩඉම් විභාගය | 2020.09.12 | 05 | 70,650.00 |
| 15 | | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ රස බලන්නා තනතුරට බඳවා ගැනීමේ විභාගය | 2020.09.19 | 288 | 385,725.00 |
| 16 | | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ කා. කඩඉම් විභාගය | 2020.09.10/22/ | 81 | 310,975.00 |
| 17 | | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කා. කඩඉම් විභාගය | 2020.09.30 | 02 | 38,250.00 |
| 18 | | කාන්තා, ළමා හා වියළි කලාප කටයුතු අමාත්‍යාංශයේ කා. කඩඉම් විභාගය | 2020.09.30 | 01 | 29,275.00 |
| 19 | නොවැම්බර් | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කා. කඩඉම් විභාගය | 2020.11.23 | 01 | 33,275.00 |
| 20 | | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කා. කඩඉම් විභාගය | 2020.11.12 | 01 | 29,275.00 |

**2020 වර්ෂයේ පුහුණු කටයුතුවල දළ ආදායම**




ප්‍රස්තාරය 2.3 2020 වර්ෂයේ විභාග කටයුතුවල දළ ආදායම

# තුන්වන පරිච්ඡේදය

## ආයතනයේ කාර්යසාධන දර්ශක

## (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව සහ මානව සම්පත් පැතිකඩ)

## 3.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 3.1 වැඩසටහන් මඟින් උපයා ගැනීමට ඉලක්ක ගත කළ සහ උපයන ලද මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | මූල්‍ය (රුපියල්) | | භෞතික | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| ඩිප්ලෝමා වැඩසටහන් | 6,728,000.00 | 6,054,000.00 | 06 | 05 |
| සහතිකපත්‍ර පාඨමාලා | 1,898,000.00 | 2,122,000.00 | 06 | 06 |
| ඉල්ලීම මත සිදු කරන ලද පුහුණු වැඩසටහන් | 1,953,000.00 | 420,000.00 | 35 | 05 |
| කෙටි කාලීන පුහුණු වැඩසටහන් | 3,776,000.00 | 1,897,000.00 | 41 | 17 |
| පුහුණු වැඩමුළු | 495,000.00 | 100,000.00 | 05 | 01 |
| විභාග පැවැත්වීම | 6,000,000.00 | 3,030,605.00 | 18 | 20 |
| එකතුව | 20,250,000 | 13,623,606.00 | | |

## 3.2 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගුව 3.2 ආයතනයේ සේවක සංඛ්‍යාව

| අනු අංකය | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| 1 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 03 | 13 | 05 | 18 | 08 | 05 | 02 | 45 | 18 | 27 |

## 3.3 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

2019 වසරේදී ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළ පුරප්පාඩු 04ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇති අතර 2020 වසරේ ඇතිවූ කොවිඩ් -19 වසංගත තත්ත්වයත් සමඟ ආයතනයේ මූල්‍ය තත්ත්වය අභියෝග රාශියකට ලක්විය. ආයතනයේ දැනට පවතින මූල්‍ය තත්ත්වය මත අනුමත සියලු කාර්ය මණ්ඩල ඒ අයුරින් ම බඳවාගැනීමට හැකියාවක් නොමැත. එය ආයතනයට දරාගත නොහැකි වැය බරකි. එබැවින්, අවම කාර්ය මණ්ඩලයක් යටතේ උපරිම ඵලදායිතාවයකින් හා කාර්යක්ෂමතාවකින් යුතුව ආයතනය පවත්වාගෙන යන අතර එම පියවර ගැනීම මඟින් ආයතනයේ වියදම් කළමනාකරණ කර ගැනීමට හැකි වී ඇති බව පෙන්වා දිය හැකි ය.

## 3.4 මානව සම්පත් සංවර්ධනය

නිලධාරින් වෙත ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු කිහිපයක් වේ. නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනය ඉන් ප්‍රධාන ය. සීමිත ප්‍රතිපාදන සහ සම්පත් සමඟ කටයුතු කරමින් නව මාධ්‍ය හා තාක්ෂණය තම රාජකාරී වෘත්තිය සංවර්ධනය සඳහා භාවිතා කිරීමට නිලධාරින් පෙළඹවීම තුළින් ඔවුන්ගේ රාජකාරි ඵලදායිතාව ඉහළ නැංවීමට මෙම පුහුණු වැඩසටහන් ඉතා උපකාරී වේ. තවද ආකල්පමය වශයෙන් නිලධාරීන් සංවර්ධනය කිරීම තුළින් හා නිලධාරින්ගේ භාෂා නිපුණතාවය ඉහළ නැංවීම තුළින් මහජනතාවට වඩා සමීප සේවාවක් ලබාදීමට නිලධාරීන්ට හැකි වන අතර එය ඵලදායී ආයතනික අන්තර් සම්බන්ධතා ගොඩනැගීමට ද ඉවහල් වේ. ක්‍රමානුකූල මනා අධ්‍යයනයකින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා සඳහා අදාළ නිලධාරින් නිසිපරිදි යොමු කිරීමෙන් රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල පළපුරුදු තෘප්තිමත් නිලධාරි කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන්වලට යොමු කිරීමේ පොදු අරමුණ වේ. 2020 වර්ෂය තුළ දේශීය පුහුණු පාඨමාලාවලට නිලධාරීන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

### 3.5 දේශීය පුහුණු පාඨමාලා

වගුව 3.3 කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්

| පුහුණු වැඩමුළුව/ පාඨමාලාවේ නම | පැවැත්වූ ස්ථානය | දිනය | සහභාගී වූ නිලධාරීන් | වියදම් වූ ප්‍රතිපාදන මුදල (රු.) |
|---|---|---|---|---|
| 1. කම්කරු නීති හා කාර්මික සබඳතා | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2019 /2020 | 1. එස් ජේ එස් ආර් හල්ලල මහතා<br>2. එන් එම් ජෝතිපාල මිය | 96,000.00 |
| 2. කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2020.02.24 හා 25 | 1. ශර්මිලා රිෆාන් මිය | 8,000.00 |
| 3. විගණන විමසුම් සඳහා පිළිතුරු | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2020.02.20,27 හා 2020.03.05 | 1. ලාංකිකා වීරසිංහ මිය<br>2. රුචිර චන්දිම මයා | 20,000.00 |
| 4. ලිපි ගොනුකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 2020.08.24 | 1. ශර්මිලා රිෆාන් මිය<br>2. ජයනි දර්ශිකා මිය<br>3. ඩබ් එම් කේ එච් වනිගසේකර මෙය<br>4. මුදිතා කණ්ඩම්බි මෙය | - |

# හතරවන පරිච්ඡේදය

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

4.1 2020.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ආදායම** | | | |
| ආදායම | 4 | 15,932,955.01 | 34,124,988.63 |
| පුනරාවර්තන - ප්‍රතිපූර්ණය | 5 | 6,100,000.00 | 10,768,853.53 |
| **මුළු ආදායම** | | 22,032,955.01 | 44,893,842.16 |
| | | | |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 6 | 14,506,256.23 | 14,220,042.83 |
| ගමන් ගාස්තු | 7 | 66,200.00 | 3,256,997.11 |
| සැපයුම් සහ භාවිතා කළ පරිභෝජ්‍ය ද්‍රව්‍ය | 8 | 928,811.80 | 1,087,028.72 |
| නඩත්තුව | 9 | 1,405,113.56 | 1,574,247.53 |
| ගිවිසුම්කර සේවා | 10 | 6,175,515.60 | 9,408,565.93 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 11 | 2,005,803.84 | 1,708,668.62 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 12 | 1,197,614.00 | 2,560,507.79 |
| වැඩසටහන් ක්‍රියාකාරකම් | 13 | 3,173,958.88 | 10,867,467.23 |
| **මුළු මෙහෙයුම් වියදම්** | | 29,459,273.91 | 44,683,525.76 |
| | | | |
| **ශුද්ධ අතිරික්තය (හිඟය)** | | (7,426,318.90) | 210,316.40 |
| | | | |

## 4.2 2020.12.31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 14 | 9,856,537.24 | 10,580,528.78 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 15 | 1,087,429.45 | 1,170,525.15 |
| ලැබිය යුතු දෑ | 16 | 2,399,259.85 | 11,094,380.92 |
| මුදල් අත්තිකාරම් | 18 | - | 1,250.00 |
| ස්ථාවර තැන්පතුව | 24 | 38,779,423.17 | 26,172,513.93 |
| මුදල් හා මුදල් සමාන දෑ | 19 | 10,495,247.31 | 19,918,387.00 |
| **මුළු වත්කම්** | | 62,617,897.02 | 68,937,585.78 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| උපචිත වියදම් | 20 | 6,079,891.94 | 1,588,763.23 |
| කළින් ලැබීම් | 17 | 1,618,086.25 | 1,631,000.00 |
| **මුළු ශුද්ධ වත්කම්** | | 54,919,918.83 | 65,717,822.55 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | | |
| සමුච්චිත අරමුදල | | | |
| 2020.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය | | 65,717,822.55 | 64,187,120.89 |
| පෙර වර්ෂ සඳහා ගැලපුම් | 21 | (4,408,727.67) | 296,500.00 |
| 2020.01.01 දිනට ගැලපූ ශේෂය | | 61,309,094.88 | 64,483,620.89 |
| .......................... | 22 | 1,000,000.00 | 198,553.00 |
| අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් | 23 | 37,142.85 | 825,332.26 |
| වර්ෂය සඳහා අතිරික්තය / හිඟය | | (7,426,318.90) | 210,316.40 |
| | | 54,919,918.83 | 65,717,822.55 |

පිටු 07 සහ 09 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු 10 සිට 36 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඔවුන් වෙනුවෙන් අත්සන් කරනු ලැබ ඇත.

**ලංකිකා වික්‍රමසිංහ**
ගණකාධිකාරී

**ජේ.එම්.එස්.පී.බී. ජයතිලක**
අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන)

**ඩී.ඩබ්.ඩබ්.පී. ගුණරත්න**
පාලන මණ්ඩල සාමාජික

**එම්.පී.ඩී.යූ.කේ. මාපා පතිරණ**
සභාපති

## 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අතිරික්තය / (හිඟය) | | (7,426,318.90) | (2,411,905.03) |
| **ගැලපීම්** | | | |
| අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා වැටුප් | 23 | 37,142.85 | 825,332.26 |
| ක්ෂය වීම් | 11 | 2,005,803.84 | 1,708,668.62 |
| ස්ථාවර තැන්පතුවලින් ආයෝජන ආදායම | | (2,604,707.06) | (2,433,066.36) |
| **කාරක ප්‍රාග්ධන ගාස්තුවලට පෙර මෙහෙයුම් ලාභය** | | **(7,988,079.27)** | **(2,310,970.51)** |
| තොග (වැඩි වීම) / අඩු වීම | 15 | 83,095.70 | (129,875.48) |
| ලැබිය යුතු දෑ (වැඩි වීම) / අඩු වීම | 25 | 8,692,918.89 | 4,226,215.92 |
| මුදල් අත්තිකාරම්වල (වැඩි වීම) / අඩු වීම | 18 | 1,250.00 | 3,750.00 |
| උපචිත වීම් (වැඩි වීම) / අඩු වීම | 20 | 4,491,128.71 | (1,928,193.39) |
| කලින් ලැබුණු ආදායම (වැඩි වීම) / අඩු වීම | 17 | (12,913.75) | 681,000.00 |
| පෙර වර්ෂවල ගැලපීම් | 21 | (4,408,727.67) | 296,500.00 |
| මෙහෙයුම්වලින් උත්පාදිත මුදල් | | **858,672.61** | **838,426.54** |
| මූල්‍ය පිරිවැය | | **-** | **-** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | | **858,672.61** | **838,426.54** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | |
| පිරියත හා උපකරණ අත්කර ගැනුම | 14 | (1,281,812.30) | (620,002.99) |
| ස්ථාවර තැන්පතු ආයෝජනය | | (10,000,000.00) | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(11,281,812.30)** | **(620,002.99)** |
| | | | |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපූරණය | 22 | 1,000,000.00 | 198,553.00 |
| **මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **1,000,000.00** | **198,553.00** |
| | | | |
| මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ (වැඩි වීම) / අඩු වීම | | (9,423,139.69) | 3,039,197.98 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 19 | 19,918,387.00 | 16,879,189.02 |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | 19 | **10,495,247.31** | **19,918,387.00** |

### 4.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

#### 4.4.1 ආයතන තොරතුරු

##### 4.4.1.1 මූලික හැඳින්වීම

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය ප්‍රතිව්‍යුහගත කරමින් කම්කරු විෂය භාර අමාත්‍යාංශය යටතේ 2007 වර්ෂයේ සැප්තැම්බර් හිදී පිහිටුවන ලද මෙම ආයතනය 2010 අංක 12 දරණ පනත බලාත්මක කිරීම ඔස්සේ පාර්ලිමේන්තුව විසින් නීත්‍යානුකූලව ස්ථාපිත කරන ලදී. මෙම පනතට අනුකූලව සේවා යෝජකයින්, වෘත්තීය සමිති සහ රාජ්‍ය නිලධාරීන් නියෝජනය කරමින් සේවාදායකයින් ඇතුළු කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන්ගේ නියෝජිතයින්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් ආයතනය පාලනය කරනු ලැබේ. වර්තමානයේදී මෙම ආයතනය දෙවැනි මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05 ලිපිනයේ පිහිටා ඇත.

##### 4.4.1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වාභාවය

කම්කරු නීතිය සහ කාර්මික සබඳතා විෂය ක්ෂේත්‍රයට අදාළව විවිධ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පැවැත්වීම, වැඩපොළ ඵලදායීතාවය ඉහළ නැංවීම සහ ප්‍රකාශන කටයුතු සිදු කිරීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූලික ක්‍රියාකාරකම් ලෙස දැක්විය හැක.

##### 4.4.1.3 ආයතන කාර්ය මණ්ඩලය

2007 සැප්තැම්බර් මාසයේ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කළද, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ සේවක සංඛ්‍යාව අනුමත කිරීම 2014 මාර්තු මාසයේදී සිදු වී ඇත. මෙම පසුබිම යටතේ කම්කරු අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ආයතනය වෙත මෙහෙයුම් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර ඇති අතර එම නිලධාරීන්ගේ වැටුප් අදාළ ආයතන විසින් ගෙවා ඇත. එම නිසා මෙම මූල්‍ය ප්‍රකාශයේ සඳහන් සේවක පිරිස් සඳහා වේතන සහ වැටුප් දීමනා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මෙන්ම කම්කරු අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ.

##### 4.4.1.4 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය කළමණාකරණය

ආයතනයේ මූලාරම්භයේ සිට 2011 සැප්තැම්බර් 30 වන දින දක්වා ආයතනයේ මූල්‍ය කළමණාකරණය කම්කරු අමාත්‍යාංශය විසින් සිදුකර ඇත. (කාර්ය මණ්ඩලය සහ වෙනත් බාධක හේතුවෙන්)

#### 4.4.2. පිළියෙළ කිරීමේ පදනම

##### 4.4.2.1 අනුකූලතා ප්‍රකාශනය

ජාතික ශ්‍රම අධ්‍යයනයේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශය සඳහා වූ සටහන්වලින් සමන්විත වෙයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව මෙම ප්‍රකාශයන් පිළියෙළ කරන ලදී.

##### 4.4.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙළ කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශයනයන්ගේ උද්ධමනීය කාරණාවන් සඳහා ගැලපීම් සිදුකර නැත.

#### 4.4.2.3 පවතින ව්‍යාපාර

පවතින ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීමට ඇති හැකියාව ස්ථාපිත කිරීමේ තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදුකර ඇති අතර ඔවුන් විසින් ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු අවසන් කිරීමට අදහස් නොකරයි.

#### 4.4.2.4 සංසන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් නිරන්තරව යාවත්කාලීන කරමින් භාවිත කරන අතර එම නිසා පසුගිය වර්ෂයේ භාවිතා කළ ඒවා සමග ඒවා අනුකූල නොවෙයි. පවත්නා (වර්තමාන) වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවකදී පමණක් පසුගිය වර්ෂයේ දත්ත තොරතුරු සහ ප්‍රකාශන නැවත සකස් කර භාවිතයට ගනු ලැබේ.

#### 4.4.2.5 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබේ.

#### 4.4.2.6 සැලකිලිමත් විය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා අනුකූලව යොදවා ඇත.

#### 4.4.3.1 දේපළ, පිරියත සහ උපකරණ

වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි වැඩ කරන තත්ත්වයට ගෙන ඒමේදී සිදු වූ යම් යම් වියදම් සමඟ එන අත්පත් කරගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයයි. පිරිවැයේදී වත්කමක් ලෙස මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නැවත අගය කරන ලද වත්කම් එයින් ඇතිවන කිසියම් ක්ෂය වීමක් අඩු කිරීමෙන් අනතුරුව නැවත අගය කරන ලද ප්‍රමාණයෙන් ගෙනයනු ලබයි. අනෙකුත් සියලුම වත්කම්, පිරියත සහ උපකරණවල සමුච්චිත ක්ෂය අඩුකර පිරිවැය සඳහන් කරනු ලැබේ. වෙනස් භාවිතයට ගත හැකි ජීවන කාලයක් පවතින ප්‍රධාන උපාංගවලින් පිරියත සහ උපකරණ අයිතමයක් සමන්විත වන අවස්ථාවන්හිදී, එම දේපළ, පිරියත සහ උපකරණවල වෙනම අයිතමයක් ලෙස ගණනය කරනු ලැබේ. සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම අවශ්‍ය පරිදි වත්කම් අවශේෂ වටිනාකම, ප්‍රයෝජනවත් කාලයට වැඩියෙන් පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම්වලට වඩා සියලුම දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය අයකරනු ලැබේ. බැහැර දිය හැකි දිනය දක්වා භාවිතය සඳහා වත්කම් ලබාගත හැකි දිනයන් ක්ෂය වීම් ලබා දී ඇත. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 (SLPSAS 7) දේපළ පිරියත හා උපකරණහි විස්තර කර ඇති පරිදි පිරියත හා උපකරණ පිරිවැය ක්‍රමයට ගණනය කර ඇති බව පහත දක්වා ඇති පරිදි සරල රේඛීය ක්‍රමයක් මත පිරියත හා උපකරණ ක්ෂය ගණනය කරනු ලැබේ.

භාවිත කරන ලද මූලික වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

වගුව 4.1

| | 2020 |
|---|---|
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | වර්ෂ 10 |
| ලී භාණ්ඩ සහ උපකරණ | වර්ෂ 13 (7.5%) |
| පරිගණක | වර්ෂ 10 |
| නාම පුවරු හා වෙනත් | වර්ෂ 03 |
| පොත් පත් | වර්ෂ 05 |

2013.10.02 දිනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දේපළ, පිරියත හා උපකරණ නැවත තක්සේරු කර ඇති අතර 2014.01.07 දින අදාළ වාර්තාව නිකුත් කර ඇත.

#### 4.4.3.2 තොග (Innevtory)

මූල්‍ය වර්ෂය තුළ භාවිතා කරන ලද බඩු වට්ටෝරු පිරිවැයේදී ආදායම් සහ වියදම් ප්‍රකාශනය සඳහා අය කර තිබීණි.

#### 4.4.3.3 මුදල සහ සම වටිනාකම

මුදල් සහ සම වටිනාකම්, අතැති මුදල් හා බැංකුවල තැන්පත් කරන මුදල්වලින් සමන්විත වෙයි.

#### 4.4.3.4 වගකීම සහ විධිවිධාන

අතීත සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් පවතින විට ශේෂ පත්‍රය තුළ වගකීම හඳුනාගනු ලැබේ. ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් පිටතට ගලායැමක් එහි නිරවුල් කරලීමෙන් අපේක්ෂා කරනු ලබයි. ණයකරුවෙකුගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයෙන් වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු බැඳීම සලකනු ලබන්නේ ශේෂ පත්‍රයේ වර්තමාන වගකීම් ලෙසය. අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස, විශ්වාසනීය ලෙස තක්සේරු කළ හැකි වර්තමාන නෛතික හෝ අනුමත බඳවා ගැනීමක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සඳහා ඇත්නම් ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර බැඳීම් නිරවුල් කරගැනීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යැමක් අවශ්‍ය බවට නිශ්චය කළ හැකි වේ.

#### 4.4.3.5 ආදායම හඳුනාගැනීම

භාණ්ඩ ලබා දී පවරා ඇති අවස්ථාවක භාණ්ඩ / සේවාවන්ගේ අලෙවියෙන් ආදායම හඳුනාගනු ලැබේ. සලකා බලන ලද ලැබීම් සහ ලැබිය හැකි සාධාරණ වටිනාකම්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් එකතු කරගත් බදු ආශ්‍රිත අඩු කිරීම් හා අලෙවි කිරීම් දළ වශයෙන් ආදායමක් දක්වනු ලැබේ.

#### ආදායම් පදනම

පාඨමාලාවලට සහභාගීවන්නන් සඳහා ගෙවීම් සිදුකිරීමේදී උපචිත පදනම මත ආදායම් ගණනය කරනු ලැබේ. නොවැලැක්විය හැකි හේතුන් නිසා සමහර සහභාගීවන්නන් විසින් නියමිත කාලය සම්පූර්ණ කිරීමට පෙර පාඨමාලාව අත්හරිනු ලබන අතර විවිධ හේතුන් නිසා ඇතැම් පාඨමාලා ගාස්තුන් අයකරගත නොහැකිය. මෙම ලැබීම් ආදායමක් ලෙස සලකා බලා නොමැත. කෙසේවෙතත්, එවැනි අවස්ථාවලදී හැකිනම් ඉතිරි ප්‍රමාණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. පාඨමාලාවේ සමස්ත ආදායම තීරණය කරනු ලබන්නේ පාඨමාලාවේ වර්ෂය සඳහාය.

#### 4.4.3.6 ලැබීම්

ඍණාත්මක සහ සැක සහිත ලැබීම් සඳහා දළ දීමනා වටහා ගැනීමට තක්සේරු කර ඇති බවට වෙළඳ ලැබීම් ප්‍රමාණයන්ගෙන් සටහන් කරන ලදී. අදාළ පාර්ශවයන්ගෙන් වෙනත් ලැබීම් හා අයවීම් අයහපත් සහ සැක සහිත ලැබීම් සඳහා දීමනාවන් පිරිවැයෙන් අඩු කරනු ලබයි.

#### 4.4.3.7 අර්ථ දක්වන ලද දායක මුදල් සැලසුම්

නිර්වචනය කරන ලද දායක මුදල් සැලැස්මක් යනුවෙන් අදහස් කරන්නේ වෙනම කොටසකට ස්ථාවරදායක මුදල් ගෙවන කොටසක් යටතේ වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලැස්මක් වන අතර වැඩිපුර ප්‍රමාණයක් ගෙවීම සඳහා නෛතික හෝ අනුමිත බැඳීමක් නොමැත. සෑම සේවකයෙක්ම ආවරණය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදලට දායක වීම සඳහා වූ බැඳීම් සිදුවූ පාඩු හෝ ලාභ වියදම් ලෙස හඳුනාගනු ලැබේ. අර්ථසාධක අරමුදල් සහ භාරකාර අරමුදල් ලෙස සේවකයන්ගේ දළ වේතනයෙන් 12% සහ 3%ක් වශයෙන් පිළිවෙලින් සමාගම දායක මුදල් ගෙවයි.

#### 4.4.3.8 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව (SLPSAS) මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

## 4.5 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. LEW/A/NILS/1/2020/4
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021 ජූලි 30 දින

සභාපති
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
විගණකාධිපති.

පිටපත : 1. ලේකම්, කම්කරු අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | LEW/A/NILS/1/2020/4 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021 ජූලි 27 |

සභාපති
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට ආයතනයේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම්

2

නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

3

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාගාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 : 2 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| (i) 3.1.2 ඡේදය | සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර පසුගිය වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2021 අප්‍රේල් 09 දින දක්වාම අවසන් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 3 (ආ), 3 (ඇ) හා 3 (ඈ) උපවගන්ති ප්‍රකාරව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සඟරා, ජර්නල් සහ පොත් පළ කිරීම, සමීක්ෂණ වාර්තා නිකුත් කිරීම හා පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වුවත් 2021 මාර්තු 31 දින දක්වාම එම අරමුණු ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

5

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. වෙනත් කරුණු

(අ) ආයතනයේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රඳවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් කෙටිකාලීන ඉතුරුම් ක්‍රමයක ආයෝජනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේම රු.මිලියන 5 සිට රු.මිලියන 21 ක් දක්වා ප්‍රමාණයන් බැංකු ජංගම ගිණුමේ ශේෂව පැවතුණි. එමගින් අරමුදලට උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2001 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය වෙත පරිත්‍යාග කර තිබූ වෑන් රථයක් 2008 වර්ෂයේදී සේවක අධ්‍යාපන අංශය කම්කරු දෙපාර්තමේන්තුවෙන් වෙන්ව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත කරන විට ආයතනය භාරදී තිබුණද මෙම වාහනය ආයතනය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණි. වාහනයෙහි කාර්මික දෝෂයක් හේතුවෙන් ධාවනයෙන් ඉවත්කර තිබූ නමුත් මෙම වාහනයේ ලියාපදිංචි අංකයට සමාන ලියාපදිංචි අංකයක් සහිතව පෞද්ගලික හිමිකරුවෙකු සතුව වෑන් රථයක් පවතින බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබුණි. මේ අනුව ආයතනය විසින් කොළඹ වංචා විමර්ශන කාර්යාංශය වෙත 2020 ජනවාරි 05 දින පැමිණිලි කර තිබූ අතර එම කාර්යාංශය විසින් අධිකරණ නියෝගයක් මගින් එම වාහනයට අදාල මුල් ගොනුව හා පැවරුම් ගොනුව කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට දන්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දිනටත් එම ගොනු ලබානොදීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු නැවතී තිබුණි.

(ඇ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 45 දෙනෙකු වන අතර 2020 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 17 ක් එනම්, අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 38 ක් විය. මේ අතර ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 09 න් 06 ක් ම පුරප්පාඩුව පැවතුණි.

(ඈ) රාජ්‍ය අංශයේ සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතනවල ඉල්ලීම පරිදි කාර්යමණ්ඩල බඳවා ගැනීම, කාර්යක්ෂමතා කඩඉම් සහ ඇගයීම් හා

සේවා උසස් කිරීම සඳහා වූ විභාග ආයතනික අවශ්‍යතා මත විභාග අංශය විසින් පවත්වනු ලැබේ. නමුත් ප්‍රශ්නපත්‍ර සැකසීම, පිළිතුරු පත්‍ර ඇගයීම මණ්ඩලයක් විසින් නොව එකම පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන අතර මෙමගින් විභාග විෂමතාවයන් ඇතිවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. තවද, විභාග පැවැත්වීම සම්බන්ධයෙන් ආයතනයේ පවතින අභ්‍යන්තර ක්‍රමවේදය දැක්වෙන ප්‍රවාහ සටහන්, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සම්බන්ධ පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම සඳහා සලසා ඇති පාලන ක්‍රම ආදියේ ප්‍රමාණවත් බව ඇගයීම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2020 ජූලි මාසයේදී පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර තිබූ අතර එම අංශය සඳහා වැඩබලන සහකාර අධ්‍යක්ෂ පමණක් සිටින අතර වෙනත් කාර්ය මණ්ඩලයක් 2021 අප්‍රේල් 10 දිනටත් අනුයුක්ත කර නොතිබුණි. ඒ අනුව මෙම අංශය පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීම ඉතා මන්දගාමී තත්වයක පැවතුණි.

(ඊ) 2020 අගෝස්තු 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ I කොටස (i) ඡේදයට අනුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍ය විෂය පථයට ඇතුලත් වුවත්, 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත ක්‍රියාත්මක කලයුතු නීති සහ අණපනත් යටතේ සඳහන් කර නොතිබුණි.

(උ) 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2021 අප්‍රේල් 10 දිනටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

## 4.6 විගණකාධිපති වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත්/ ගැනීමට එකඟ වූ ක්‍රියාමාර්ග

2.2.2 (අ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරියේදී කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට කටයුතු භෞතිකව අවසන් කිරීමේ වැදගත්කම පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කර ඇති අතර ඉදිරියේදී එම කටයුතු නියමිත දිනට අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 ප්‍රකාශන විධිමත්ව නිකුත් කිරීම හා ප්‍රකාශන සහ ව්‍යාපෘති විෂය ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමේ අරමුණින් 2020 ජූනි මස පවත්වන ලද 45 වන පාලක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කිරීමෙන් ලද අනුමැතිය ප්‍රකාරව පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති නමින් අංශයක් ස්ථාපිත කර අදාළ කටයුතු සිදු කරගෙන යනු ලබයි. ජාතික ශ්‍රම අධ්‍යනය ආයතනය විසින් කම්කරු නීතී මෙන්ම සිදු කරනු ලබන වැඩසටහන් පිළිබඳව ඉලක්ක ගත කණ්ඩායම් දැනුවත් කිරීම, අරමුණු කරගනිමින් "NILS News letters" නමින් වාර ප්‍රකාශනයක් නිකුත් කර ඇත. මීට අමතරව 2020 වර්ෂයේ සිට වාර්ෂිකව ශ්‍රම අධ්‍යනය විෂයට අදාළව පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබීය. ඒ අනුව "Women at Work" යන තේමාව යටතේ පර්යේෂණ සම්මන්ත්‍රණය, එම අවස්ථාවේ පැවති දැඩි කොවිඩ් තත්වය සමඟ 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර පසුව 2021 මාර්තු 15 දින මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ ගරු අමාත්‍ය නිමල් සිරිපාල සිල්වා මැතිතුමාගේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එහිදී අවසානයට තේරී පත් වී තිබූ පර්යේෂණ ලිපි 10ක් සඳහා පර්යේෂකයන් ඉදිරිපත් කිරීම් සිදු කළ අතර එම අවස්ථාවට zoom තාක්ෂණය ඔස්සේ 60දෙනෙකු සෘජුව සහභාගී වූ අතර විශ්ව විද්‍යාල සිසුන් ද සහභාගී විය.

2.2.4 විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවක් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර මිළදී ගැනීම් සිදුකර ඇත.

**වෙනත් කරුණු**

(අ) බැංකු ගිණුම ශේෂ පත්‍රය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව පාලක මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2020.10.13 දින ඉදිරිපත් කර රු.මිලියන 06ක් ජංගම ගිණුමක පවත්වාගෙන යාම අනර්ථකාරි බැවින් මාසික වියදම දැරීමට තරම් ප්‍රමාණවත් මුදලක් ජංගම ගිණුමේ තබා ඉතිරිය ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීමට හෝ බැංකුව සමඟ සාකච්ඡා කර කෙටිකාලීන ආයෝජනවල යෙදවීමට අනුමැතිය ලබා දී ඇත. එසේ වුවද එම අවස්ථාවේ රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්වයේ බලපෑමෙන් ආයතනයේ පුහුණු වැඩසටහන් හා විභාග පැවැත්වීම අඩාලවීම හේතුවෙන් බලාපොරොත්තු පරිදි ආදායම් නොලැබීම මත සහ භාණ්ඩාගාර අග්‍රිම නිසිකලට නොලැබීම හේතුවෙන් ද්‍රවශීලතාවය ආරක්ෂා කිරීම සඳහා අදාළ මුදල් ස්ථාවර ගිණුමක තැන්පත් කිරීමට නොහැකි වාතාවරණයක් උදා වූ බැවින් එය ඉටු කිරීම පසුවට කල් දමන ලදී.මේ වන විට ද්‍රවශීලතාවය ආරක්ෂා කර ගැනීමට ප්‍රමාණවත් මුදලක් ජංගම ගිණුමේ රඳවාගෙන ඉතිරි මුදල් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කිරීමට පියවර ගෙන ඇත.

(ආ) මෙම වෑන් රථය පිළිබඳ කොළඹ වංචා විමර්ශන කාර්යාංශය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව මෙම වාහනයට අදාළ මුල් ගොනුව හා පැවරුම් ගොනුව ලබා දෙන ලෙස

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දන්වා යවා ඇත.ඒ අනුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙතින් එම විස්තර ඉල්ලා ඇති වුවද තවමත් එය ලබා දී නොමැත.

(ඈ) 2019 වසරේදී ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළ පුරප්පාඩු 04ක් පිරවීමට කටයුතු කර ඇති අතර 2020 වසරේ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්වයත් සමඟ ආයතනයේ මූල්‍ය තත්වය අභියෝග රාශියකට ලක් විය. දැනට ආයතනයේ පවතින මූල්‍ය තත්වය මත අනුමත සියලු කාර්ය මණ්ඩල ඒ අයුරින්ම බඳවා ගැනීමට හැකියාවක් නොමැති අතර, එසේ බඳවා ගැනීම සිදු කල හොත් වැටුප් හා දීමනා වන වැය බර මේ අවස්ථාවේදී ආයතනයට දරා ගත නොහැකි වැය බරකි.තවද ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අනුමත කාර්ය මණ්ඩල සංයුතිය පිළිබද නැවත සමාලෝචනයක් සිදුකර අත්‍යාවශ්‍යය කාර්ය මණ්ඩල ප්‍රමාණය පිළිබද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය සංශෝධන ලබා ගැනීමට නියමිතය.

(ඇ) විභාග අංශයට අදාළව සම්පත්දායක සංචිතය තෝරා ගැනීම සහ ගෙවීම් සහ කටයුතු විධිමත් කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වාදෙමින් 2021 පෙබරවාරි මස 02 වන දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී පත්‍රිකා 02ක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ හරහා විභාග අංශයේ කටයුතු වඩා විධිමත් කිරීම සහ බාහිර ආයතනයන්ට ගුණාත්මක සේවාවක් සැපයීම අරමුණු කරගන්නා ලදී. විභාග විෂමතාවයක් ඇති වීම වළක්වා ගැනීම, පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා කළ හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමේ අවශ්‍යතාවය අප ආයතනය විසින් හඳුනාගෙන ඇති අතර තවදුරටත් ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේද අවධානය යොමු කර ඇත.කෙසේ වෙතත් මේ වන තෙක් පවත්වා ඇති විභාග සම්බන්ධ කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු නිරන්තර අධීක්ෂණය හා නිරීක්ෂණ යටතේ සිදු කරන ලදී.

(ඉ) ආයතනය සතුව පවතින සීමිත මානව හා මූල්‍ය සම්පත් සැලකිල්ලට ගෙන පවතින මානව සම්පතින් උපරිම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමින් පවතී. එබැවින් ආයතනය මූල්‍යමය වශයෙන් ස්ථාවර වීම හා මානව සම්පත වැඩිකර ගැනීමට අතර කාලීන වශයෙන් සමබරතාවයක් පවත්වා ගනිමින් කටයුතු කරනු ලබයි. තවදුරටත් පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති අංශ සඳහා බඳවා ගැනීම් කටයුතු සිදු කිරීම සඳහා පාලක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව රට තුළ තත්වය සාමාන්‍ය තත්වයට පත් වූ විට එම තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් ඉදිරියේදී බඳවා ගැනීමට නියමිතය.

(ඊ) 2020 අගෝස්තු 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට අනුකූලව අතිගරු ජනාධිපතිතුමන්ට පැවරී ඇති බලතල යටතේ අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශවලට වලට අදාළ විෂය පථය කාර්යයන් හා කර්තව්‍යයන් සුවිශේෂී ප්‍රමුඛතා හා අදාළ ආයතනික හා නෛතික රාමුව තීරණය කරන බැවින් විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි අතිගරු ජනාධිපතිතුමාගේ බලතල අතික්‍රමණය කිරීමට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයට හැකියාවක් නොමැත. එසේ වුවද 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යනය ආයතන පනත අදාළ ආයතනික හා නෛතික රාමුව යටතේ ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත් යටතට එම විධිවිධාන ඇතුළත් කර දෙන කම්කරු අමාත්‍යාංශය මගින් ජනාධිපති කාර්යාලයේදී මේ සම්බන්ධයෙන් පැවති රැස්වීම් වලදී ආයතනය වෙනුවෙන් නියෝජනයන් කර ඇත.

උ ) 2019 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර ඇත.

# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
## தேசிய தொழில் கற்கைகள் நிறுவகம்
## National Institute of Labour Studies

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මගින් බලාත්මක කරන ලදී. කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ සේවකයින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මගින් පාලනය වේ. කම්කරු අණපනත්, නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත්, ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ මූලික කාර්යභාරයයි.

தேசிய தொழில் கற்கைகள் நிறுவகமானது, தொழில் அமைச்சின் அதிகாரத்தின் கீழ் வருகின்ற நியதிச்சட்ட அமைப்பொன்றாகும். இந்த நிறுவகம், 2007 செப்ரெம்பர் 11 ஆம் திகதி தாபிக்கப்பட்டிருந்ததுடன், 2010 ஆம் ஆண்டின் 12 ஆம் இலக்க தேசிய தொழில் கற்கைகள் சட்டத்தினால் வலுப்படுத்தப்பட்டிருந்தது. இந்த நிறுவகம், முத்தரப்பு அக்கறைதாரர்களான தொழில்தருநர்கள், பணியாளர்கள் மற்றும் அரச அலுவலர்களைக் கொண்ட ஆளுநர் சபையினால் நிருவகிக்கப்படுகின்றது. இந்நிறுவகத்தின் பிரதான பணி, தொழில் சட்டங்கள், கட்டளைச்சட்டங்கள், சட்டங்கள், விதிகள் மற்றும் ஒழுங்குவிதிகள் பற்றி அறிந்துள்ள பயனுறுதிவாய்ந்த, ஆக்கத்திறனுள்ள தொழில் அணியொன்றை உருவாக்குவதற்குத் தேவையான பயிற்சி மற்றும் ஆய்வு நடவடிக்கைகளை வடிவமைப்பதும், நடைமுறைப்படுத்துவதுமாகும்,

The National Institute of Labour Studies is a statutory body functioning under the Ministry of Labor. This Institute was established on 11 September 2007 and was empowered by the National Institute of Labour Studies Act No. 12 of 2010. This Institute is governed by a governing body consisting of the tripartite partners, the employers, the employees and the public servants. The primary role of this Institute is to design and implement the training and research activities required to create an effective and productive workforce that is aware of labour Acts, Ordinance, laws, rules and regulations.

2 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, කොළඹ 05.
2 ஆவது தளம் தொழில் செயலகம், கொழும்பு 05.
2nd Floor, Labour Secretariat, Colombo 5.

Tel : 0112 786541/ 0112 786548 | Email : admin@nils.gov.lk | Web : www.nils.gov.lk

PRINTEC | 0112 815 816